**කොළඹ විශ්වවිද්‍යාලය - 2010**

--------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

--------------------

1.1 **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, කොළඹ විශ්වවිද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශනපිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------------------------

1.2.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------------------

සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළිබඳවවූ විගණන නියැදි පරීක්ෂණ වලදී අනාවරණය වූ එකතුව රු. 35,865,369 ක් වූ ගණම්කරණ අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත යොමු කරණ ලදී. එම ගණම්කරණ අඩුපාඩු නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2011 ජූලි 12 දින නැවත විගණනයට ඉදිරිපත් කරණ ලදී. මුදල් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුලත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කළයුතු වුවත් කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර තිබුණේ දින 61 ප්‍රමාද වී 2011 මැයි 02 දිනය.

1.2.2 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

---------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ බාහිර පාඨමාලා (Extention Courses) සමස්ථ අතිරික්තයට රු.366,023,680 ක් සංචිත වලට මාරුකර තිබූ අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 29 හි 19 වගන්තියට අනුවඑම සමස්ථ අතිරික්තයෙන් අවසන් වූ පාඨමාලාවන්ට අදාල අතිරික්තය , අදායම් වියදම් ගිණුමට මාරුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 29 හි 33 වගන්තියට අනව බාහිර පාඨමාලා වලට අදාල දල අදායම, අදායම් වියදම් ගිණුමෙහි නොදක්වා බාහිර පාඨමාලාවල අයභාර වියදමට සමාන අගයක් වූ රු.255,065,984 ක් අදායම ලෙස දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක18 අනුව 2009 ජුලි 22 දින ඉදිකිරීම් කටයුතු නිමකර භාරදී තිබුණ සෙරම් කාන්තා නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා දරන ලද රු.133,418,588 පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේදී ඉහත ගොඩනැගිල්ල භාවිතා කර තිබුණද ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

(අ) ගිවිසුම් කඩ කිරීම වෙනුවෙන් ලැබියයුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවසහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ 10 පරිච්ඡේදයේ 33 වගන්තිය ප්‍රකාරව ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන් 43 ක ගෙන් රු.46,242,958 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයවියයුතුව තිබුණි.

(ii) ආචාර්යවරුන් 04 ක ගෙන් අයවියයුතු රු.9,382,276 ක මුදලක් අයකරගැනීම සඳහා ඔවුනට විරුද්ධව නඩු පැවරීම සඳහා අදාල ලියකියවිලි නීතිපති දෙපාර්තමේන්තුවට යොමුකර තිබුන අතර ආචාර්යවරුන් 07 ක ගෙන් අයවියයුතු රු.1,892,023 ක මුදලක් වෙනුවෙන් අධිකරණයේ නඩු විභාග වෙමින් පැවතුණි.

(iii) ආචාර්යවරුන් 24 ක ගෙන් අයවියයුතු රු.7,817,611 ක මුදලක් ඔවුන්ගේ අර්ථසාධක හා පාර්තෝෂික අරමුදලින් අයකර ගැනීමට ක්‍රියාකර තිබූ අතර එම ශේෂයෙන් ආචාර්යවරුන් 15 ක ගෙන් අයවියයුතු එකතු වටිනාකම රු.1,567,605 ක ශේෂයක් අයකර ගැනීමට යෝජිතවවසර 08 කට අධික කාලයක් ඉක්මවා තිබුණද මෙතෙක් ප්‍රමාණවත් මුදලක් අයකර නොතිබුණි.

(iv) ගිවිසුම් කඩකිරීම නසා ආචාර්යවරයකුගෙන් අයවියයුතු මුළු මුදල වූ රු.1,218,641 කින් රු.1,101,730 ක් සමාලෝචිත වර්ෂයට පෙර අයවී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු මුදලක් අයවී නොතිබුණි.

(ආ) වර්ෂය අවසාන වන විට එකතු වටිනාකම රු.937,347 ක් වූ කල් ඉකුත් වූ ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය සක්‍රිය වැඩ පිළිවෙලක් නොවීය.

### 1.2.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------------------------------

නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ)1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 2003 ජූලි 18 දිනැති ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ඇමතූ ලිපිය | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් , සේවානියුක්ත භාර අරමුදල් හා පාර්තෝෂික දීමනා දායකය ගණන් බැලීමේදී අධ්‍යයන දීමනාවසැලකිල්ලට නොගතයුතු බව දක්වා ඇතත් 2005 ජූලි 01 දිනට පෙර බඳවාගත් ගත් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා එම දීමනාවසැලකිල්ලට ගෙන තිබුණි. |
| (ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99(1) වගන්තිය | සියළු උත්පාදක අදායම්, පරිත්‍යාග ඇතුළු සියළු අරමුදල් විශ්වවිද්‍යාල අරමුලට බැර කළයුතු වුවත් විශ්වවිද්‍යාලය විසින් විවිධ අරමුදල් 156 ක් පවත්වාගෙන ගොස් තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම අරමුදල් වල රු.458,065,642 ක ශේෂය විය. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා විශේෂිත වූ ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවසහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 5.2 වගන්තිය හා 2007 අගෝස්තු 24 දිනැති අංක 09/2007 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ආචාර්ය තනතුරක් නොවන තනතුරක් දරන්නෙකු වසර 60 ඉක්මවූ පසු සේවයේ යොදවාගත නොහැකි වුවද එවැනි නිලධාරීන් 03 ක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවාගෙන තිබූ අතර එම නිලධාරීන්ට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකතු |

| | |
|---|---|
| | වටිනාකම රු.2,848,224 ක් පාර්ශ්‍රමික ලෙස ගෙවා තිබුණි. |
| (ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/98, 29/98(i), 07/2007, 7/2007(i), 02/2009 හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | බ විධිවිධාන වලින් බැහැරව විශ්වවිද්‍යාලය විසින් 2003 ජනවාරි 01 දිනට පෙර බඳවාගත් සේවකයින් හට භාෂා ප්‍රවීනතා දීමනාව ගෙවා තිබුණි. |
| (ඊ) මු.රෙ. 371 හා උපකුලපතිගේ අංක බී/ඒසී/බීකේ/ඒ දරන 2010 නොවැම්බර් 12 දරන ලිපිය | ්‍යාලයේ සියළු සුළු මුදල් අත්තිකාරම් 2010 දෙසැම්බර් 31 දිනට පියවියයුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී රු.46,952 ක ශේෂයක් පියවා නොතිබුණි. |
| (උ) මු.රෙ. 371(2) | විද්‍යාල මන්දිරය , පර්යේෂණ හා කළමනාකරණ ඒකකය හා ශ්‍රීපාලි මණ්ඩපය විසින් විවිධ කාර්යයන් සඳහා ලබාගත් එකතු වටිනාකම රු,939,626 ක් වූ අත්තිකාරම් පියවීම වසර 01 සිට වසර 20 ක කාලයකසිට ප්‍රමාද වෙමින් පැවතුණි. |

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය ගණන් ගැනීමට පෙර රු.1,021,132,199 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූප ඌනතාවය රු.920,323,868 ක් විය. මේ අනුවසමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.100,808,331 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු.1,078,295,988 ක්වූ රජයේ දායකය හේතුකොට ගෙන වර්ෂය සඳහා අතිරික්තය රු.57,163,789 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ රු.1,044,350,808 ක රජයේ දායකය හේතුකොට ගෙන එම වර්ෂයේ අතිරික්තය රු.124,026,940 ක් විය.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 2.2.1 කාර්ය සාධනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010වර්ෂය සඳහා බඳවා ගන්නා ලද උපාධි අපේක්ෂකයින් 2,289 ක් වූ අතර 2009 වර්ෂයේ 2,433 ක් විය. එක් එක් පීඨ විසින් බඳවාගත් උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව පහත දැක්වේ.

| පීඨය | වර්ෂය | |
|---|---|---|
| | 2010 | 2009 |
| කලා | 665 | 661 |
| නීති | 251 | 250 |
| අධ්‍යාපන | 104 | 244 |
| කළමනාකරණ හා මූල්‍ය | 434 | 416 |
| විද්‍යා | 455 | 534 |
| වෛද්‍ය | 230 | 233 |
| ශ්‍රී පාලි මණ්ඩපය | 150 | 95 |
| එකතුව | 2,289 | 2,433 |

ඉහත තොරතුරු විශ්ලේෂණය කිරීමේදී $ අධ්‍යාපන පීඨයේ $බඳවාගැනීම් 57% පමණ පසුබැමක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුල 2,153 දෙනෙකු විශ්වවිද්‍යාලයෙන් උපාධි ලබා පිටවගොස් තිබූ අතර 2009 වර්ෂයේ එම සංඛ්‍යාව 1,838 ක් වූ අතර එක් එක් පීඨයන්ගෙන් උපාධි ලැබූ සංඛ්‍යා පහත දැක්වේ.

| පීඨය | වර්ෂය | |
|---|---|---|
| | 2010 | 2009 |
| කලා | 795 | 577 |
| නීති | 212 | 196 |
| අධ්‍යාපන | 112 | 143 |
| කළමණාකරණ හා මූල්‍ය | 348 | 348 |
| විද්‍යා | 394 | 332 |

| | | |
|---|---|---|
| වෛද්‍ය | 179 | 193 |
| ශ්‍රී පාලි මණ්ඩපය | 113 | 49 |
| | --------- | -------- |
| එකතුව | 2,153 | 1,838 |
| | ===== | ===== |

(ඈ) 2010වර්ෂයේ ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 8,359 ක් වූ අතර පසුගිය වර්ෂයේ එම සංඛ්‍යාවවූ 8,800 සමග සැසඳීමේදී 441 ක අඩුවීමකි. එම ශිෂ්‍ය සංඛ්‍යාව පීඨ අතර බෙදී ඇති ආකාරය පහත දැක්වේ.

| පීඨය | වර්ෂය | |
|---|---|---|
| | 2010 | 2009 |
| ------- | ------- | ------- |
| කලා | 2,249 | 2,785 |
| නීති | 897 | 872 |
| අධ්‍යාපන | 283 | 296 |
| කළමනාකරණ හා මූල්‍ය | 1,650 | 1,621 |
| විද්‍යා | 1,721 | 1,674 |
| වෛද්‍ය | 1,151 | 1,234 |
| ශ්‍රී පාලි මණ්ඩපය | 408 | 318 |
| | --------- | -------- |
| එකතුව | 8,359 | 8,800 |
| | ===== | ===== |

(ඈ) **දේශන පැය**

------------------

විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව ප්‍රථම උපාධිධාරීන් වෙනුවෙන් 2009/2010 අධ්‍යයන වර්ෂය සඳහා අභ්‍යන්තර දේශන පැය 43,327 ක් පවත්වා තිබුණි.පසුගිය වර්ෂයේ එම දේශන පැය සංඛ්‍යාව35,880 කි. ප්‍රථම හා පශ්චාත් උපාධිධාරීන් සඳහා බාහිර දේශන පැය 11,418 ක් පවත්වා තිබූ අතර පසුගිය වර්ෂයේ එම දේශන පැය සංඛ්‍යාව15,888 කි.

(ඉ) **විභාග පැවැත්වීම**

---------------------

සමාලෝචිත වර්ෂය තුල ප්‍රථම උපාධි විභාග 159 ක් ද, පශ්චාත් උපාධි ඩිප්ලෝමා විභාග 25 ක් ද, පශ්චාත් උපාධි විභාග 38 ක් ද, වෙනත් ඩිප්ලෝමා හා සහතික පත්‍ර විභාග 10 ක් ද පවත්වා තිබුණි. ඊට අනුරූපීව පසුගිය වර්ෂයේ ප්‍රථම උපාධි විභාග 143 ක් ද, පශ්චාත් උපාධි ඩිප්ලෝමා

විභාග 11 ක් ද, පශ්චාත් උපාධි විභාග 19 ක් ද, වෙනත් ඩිප්ලෝමා හා සහතික පත්‍ර විභාග 06 ක් ද පවත්වා තිබුණි.  මේ අනුව පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා පශ්චාත් උපාධි විභාග පැවැත්වීම පිළිවෙලින් 127% කින් හා 100% කින් වර්ධනයවීමක් සිදුවී තිබුණි. ඉන් බැහැරවඋපාධි අධ්‍යයන පීඨයෙහිසමාලෝචිත වර්ෂයේදීවිධායක ඩිප්ලෝමා විභාග 02 ක් ද පශ්චාත් උපාධි ඩිප්ලෝමා විභාග 11 ක් හා පශ්චාත් උපාධි විභාග 12 ක් ද පවත්වා තිබ අතර පසුගිය වර්ෂයේ එම පීඨය විසින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා විභාග 16 ක් හා පශ්චාත් උපාධි විභාග 07 ක් ද පවත්වා තිබුණි. මේ අනුව පශ්චාත් උපාධි ඩිප්ලෝමා විභාග පැවැත්වීම 31% කින් අඩුවීමක් සහ පශ්චාත් උපාධි විභාග පැවැත්වීම 71% කින් වර්ධනයක් වී තිබුණි.

## 2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) පර්යේෂණ කටයුතු සවිමත් කිරීම සඳහාසමාලෝචිත වර්ෂය වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ හා කළමනාකරණ ඒකකයට ලැබී ඇති මුළු මුදල රු.361,454,159 ව අතර වර්ෂයේ වියදම රු.327,858,544 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් විය.

(i) සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාල කාර්ය සැලැස්මේ 2.6.4 ඡේදය අනුව පර්යේෂණ හා කළමනාකරණ ඒකකය සතුව ප්‍රමුඛ පර්යේෂණ ක්ශේත්‍ර හඳුනා ගැනීම හා එම ප්‍රමුඛ ක්ශේත්‍ර සඳහා අරමුදල් ලබාගැනීම සම්බන්ධයෙන් සැලසුමක් පිළියෙල කර නොතිබුණි.

(ii) කාර්ය සැලැස්මේ 2.6.4 ප්‍රකාරව 2009-2013 සඳහා ඒකාබද්ධ පර්යේෂණ සැලැස්මක් විශ්වවිද්‍යාලය විසින් පිළියෙල කර නොතිබුණි.

(iii) කාර්ය සැලැසමේ 2.6.3.1 ප්‍රකාරව පර්යේෂණ කාර්යයන් සවිමත් කිරීම වෙනුවෙන් පරිපාලන නිලධාරින් පුහුණු කිරීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය (SDC) විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) **පුද්ගලික ආයතන වෙතින් ආරක්ෂක සේවා ලබාගැනීම**

-------------------------------------------------------------------

විශ්වවිද්‍යාල ආරක්ෂක කටයුතු කලාප 03 කට බෙදා පෞද්ගලික ආරක්ෂක ආයතන මගින් ආදාල සේවාවන් ලබාගන්නා අතර වාර්ෂික එම සේවා වටිනාකම රු.18,421,185 ක් විය. 2010 සැප්තැම්බර් 20 දිනැති සේවා පිරිනැමීමේ ලිපිය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 ඡේදයට අනුව2010 ඔක්තෝබර් 01 දින අදාල ආරක්ෂක සේවා කොන්ත්‍රාත්තු ආරම්භ වීමට ප්‍රථම දෙපාර්ශවය විසින් විධිමත් සේවා ගිවිසුමකට ඇතුලත්ව නොතිබුණි.

(ඇ) ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය පවත්වාගෙන යන විශ්වවිද්‍යාලය සතු භූමිය හා රු.116,864,648 ක් වූ ගොඩනැගිල්ල එම ආයතනයට පවරා දීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 අරමුදල් ඌන උපයෝජනය

-------------------------------------

විශ්වවිද්‍යාලයේ පිහිටුවා ඇති අරමුදල් 47 ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මකව නොතිබුණු අතර එම අරමුදල් වල පැවති එකතු ශේෂය රු.61,367,495 ක් විය. මෙම අරමුදල් වසර 1 සිට 5 දක්වා කාල පරාසයක් තුළ අක්‍රියව පැවති අතර ශේෂය ඉක්මවා වියදම් දැරීම නිසා එක් අරමුදලක රු.48,146 ක හර ශේෂයක්ද විය.

### 2.2.4 අරමුණට පටහැනි ගෙවීම්

------------------------------

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99(1) වගන්තිය යටතේ පිහිටුවා ඇති විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලේ අරමුණු ගත කාර්යයන්ට පටහැනිවසමාලෝචිත වර්ෂය තුල විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන වලින් බැහැරව පිහිටුවා තිබූ උපකුලපති අරමුදල-1 වෙත රු.700,000 ක් මාරුකර තිබුණි.

## 3. පද්ධති හා පාලන

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිවිසුම්ගත පාලනය
(ආ) ගණම්කරණය
(ඇ) අත්තිකාරම් පියවීම